# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1711/24 - 2011 ජුනි මස 24 වැනි සිකුරාදා - 2011.06.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය, දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත මේ නියමය මගින් (2010 ජුනි මස 17 වැනි දින අංක 1658/36 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත ) එකී පනතේ 139 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, ඉහත කී පනතේ 21 වැනි වගන්තිය යටතේ සාදන ලද නියමයක් ලෙස සලකනු ලැබිය යුතු සහ යාපනය විශ්ව විද්‍යාලය පිහිටුවනු ලැබූ නියමයේ උපලේඛනයේ I වැනි තීරයේ දැක්වෙන "වෛද්‍ය විද්‍යා පීඨය" යන සටහනට අනුරූපීව එම උපලේඛනයේ II වැනි තීරයේ දැක්වෙන "ප්‍රජා වෛද්‍ය අධ්‍යයන අංශය" යන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ. :—

"ප්‍රජා සහ පවුල් වෛද්‍ය අධ්‍යයන අංශය"

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2011 ජුනි මස 21 වැනි දින,
කොළඹ දී ය.
07 - 239/1

1A - G 14706—835 (2011/06)

එල්. ඩී. බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය, දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත මේ නියමය මගින් (2009 ජුනි මස 23 වැනි දින අංක 1607/13 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත ) එකී පනතේ 139 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, ඉහත කී පනතේ 21 වැනි වගන්තිය යටතේ සාදන ලද නියමයක් ලෙස සලකනු ලැබිය යුතු සහ කැළණිය විශ්ව විද්‍යාලය පිහිටුවනු ලැබූ නියමයේ උපලේඛනයේ I වැනි තීරයේ දැක්වෙන "වාණිජ හා කළමනාකරන අධ්‍යයන පීඨය" යන සටහනට අනුරූපීව, එහි II වැනි තීරයේ දැක්වෙන 4 වැනි අයිතමයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්, එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ. :—

"5. මූල්‍ය අධ්‍යයන අංශය ".

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2011 ජුනි මස 21 වැනි දින,
කොළඹ දී ය.

07-239/2

---

එල්. ඩී. බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය, දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත මේ නියමය මගින් (2010 ජුනි මස 17 වැනි දින අංක 1658/36 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත ) එකී පනතේ 139 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, ඉහත කී පනතේ 21 වැනි වගන්තිය යටතේ සාදන ලද නියමයක් ලෙස සලකනු ලැබිය යුතු සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය පිහිටුවනු ලැබූ නියමයේ උපලේඛනයේ I වැනි තීරයේ දැක්වෙන "පීඨය" යන ශීර්ෂය යටතේ දැක්වෙන "ශාස්ත්‍ර පීඨය" යන අයිතමය සහ ඊට අනුරූපීව, එම උපලේඛනයේ II වැනි තීරයේ "අධ්‍යයන අංශ" යන ශීර්ෂය යටතේ දැක්වෙන සියලුම අයිතම ඉවත් කර පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්, එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ. :—

| "*I වැනි තීරය*<br>*පීඨය* | *II වැනි තීරය*<br>*අධ්‍යයන අංශ* |
|---|---|
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය | 1. ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය |
| | 2. සමාජ සංඛ්‍යාන අධ්‍යයන අංශය |
| | 3. භූගෝල විද්‍යා අධ්‍යයන අංශය |
| | 4. සිංහල සහ ජන සන්නිවේදන අධ්‍යයන අංශය |
| | 5. ඉතිහාසය සහ පුරාවිද්‍යා අධ්‍යයන අංශය |
| | 6. සමාජ විද්‍යා සහ මානව විද්‍යා අධ්‍යයන අංශය |
| | 7. පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය |
| | 8. භාෂා සහ සංස්කෘතික අධ්‍යයන අංශය |
| | 9. ඉංග්‍රීසි භාෂා අධ්‍යයන අංශය |
| | 10. දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය.". |

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2011 ජුනි මස 21 වැනි දින,
කොළඹ දී ය.

07 - 239/3

එල්. ඩී. බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය, දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව, කලින් කල සංශෝධිත අග්නිදිග විශ්ව විද්‍යාලය හා සම්බන්ධ වූ 1996 මාර්තු මස 27 වැනි දින හා අංක 916/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළවූ නියමය සහ අවසන් වරට 2005 සැප්තැම්බර් මස 30 වැනි දින හා අංක 1412/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් සංශෝධිත, ඉහත කී පනතේ 21 වැනි වගන්තිය යටතේ සාදන ලද නියමය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි උපලේඛනය වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමෙන් :-

"උපලේඛනය

| *I වැනි තීරය* *පීඨය* | *II වැනි තීරය* *අධ්‍යයන අංශ* |
|---|---|
| කලා සහ සංස්කෘතික පීඨය | 1. සමාජ විද්‍යා අධ්‍යයන අංශය<br>2. භාෂා අධ්‍යයන අංශය<br>3. භූගෝල විද්‍යා අධ්‍යයන අංශය. |
| කළමනාකරණ සහ වාණිජ පීඨය | 1. කළමනාකරණ අධ්‍යයන අංශය<br>2. ගණකාධිකරණ සහ මූල්‍ය අධ්‍යයන අංශය |
| ව්‍යාපාරික විද්‍යා පීඨය | 1. ජීව විද්‍යා අධ්‍යයන අංශය<br>2. භෞතික විද්‍යා අධ්‍යයන අංශය<br>3. ගණිත විද්‍යා අධ්‍යයන අංශය. |
| ඉස්ලාම් අධ්‍යයන සහ අරාබි භාෂා පීඨය | 1. ඉස්ලාම් අධ්‍යයන අංශය<br>2. අරාබි භාෂා අධ්‍යයන අංශය"; සහ |

(2) 2005 සැප්තැම්බර් මස 30 වැනි දින අංක 1412/35 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ (2) වැනි අයිතමය මෙයින් ඉවත් කරනු ලැබේ.

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2011 ජුනි මස 21 වැනි දින,
කොළඹ දී ය.

07-239/4

---

එල්. ඩී. බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

20 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය, දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මා විසින් මෙම නියෝගය මගින්. :—

*(අ)* ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්ව විද්‍යාලයේ කටයුතුවල පරිපාලනය බරපතල ලෙස අවුල් වී ඇති බවට සෑහීමකට පත්වීමෙන් පසු 2011 ජනවාරි මස 21 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ඉහත කී විශ්වවිද්‍යාල පනත හෝ ඒ යටතේ සාදන ලද වෙනත් යම් නියමයක්, නියමාවලියක්, ප්‍රඥප්තියක්, අතුරු ව්‍යවස්ථාවක්. නියෝගයක් හෝ රීතියක් ප්‍රකාර ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, ඉටු කිරීමේ, සහ කිරීමේ කාර්යය සඳහා ඉහත කී විශ්වවිද්‍යාලය සම්බන්ධයෙන් නිසි බලධරයා වශයෙන් නිමල් රංජිත් අර්ථනායක මහතා පත් කරමි; සහ

(ආ) 20 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ සාදන ලද සහ 2011 ජනවාරි මස 24 වැනි දින දරන අංක 1690/1 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය පරිච්ඡින්න කරමි.

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2011 අප්‍රේල් මස 20 වැනි දින,
කොළඹ දී ය.

07 - 239/5

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.